ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා අධ්‍යයන පීඨය
නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව
නීතිවේදී උපාධි පාඨමාලාව - 4 මට්ටම
අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය II - 2022/2023
**LLU4805/LWU2311** – ගිවිසුම් නීතිය
කාලය - පැය 1

---

දිනය : **2023** දෙසැම්බර් 02 වේලාව: පෙ.ව 9.30 - පෙ.ව 10.30

---

එක් (1) ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.
අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

1. (අ) සුප්‍රසිද්ධ රෙදිපිළි බෙදාහරින්නෙකු වන පිනෙක්ස්, ඇගලුම් නිෂ්පාදකයෙකු වන නිෂී සමග ළඟ එන නත්තල් සමය සඳහා 100% කපු රෙදිපිළි මීටර් 1500 ක් විකිණීමේ ගිවිසුමකට එළඹුණේය. පළමු රෙදිපිළි තොගය 2023 ඔක්තෝම්බර් වන විටත්, දෙවන තොගය 2023 නොවැම්බර් වන විටත් යැවීමට පිනෙක්ස් එකග විය. පිනෙක්ස් පළමු රෙදිපිළි තොගය එකග වූ පරිදි යැවූ නමුත් දෙවන තොගයේ මිළ 10% කින් ඉහළ දැමීමට ඉල්ලා සිටින ලදී. අමතර මුදල ගෙවීමට නිෂී ප්‍රතික්ෂේප කළ විට පිනෙක්ස් ප්‍රකාශ කර සිටියේ, වැඩි කළ මිළ සඳහා නිෂී එකග නොවුණහොත් දෙවන තොගය බෙදා හැරීම සිදු නොවන බවයි. නිෂී දැනටමත් දෙසැම්බර් මාසයේදී කපු කමිස 2000ක් පාරිභෝගිකයෙකුට සැපයීමට ඇණවුමක් භාරගෙන ඇත. එම නිසා ඇය වැඩි කරන ලද මිළට දෙවන රෙදිපිළි තොගය ගැනීමට එකග වූ අතර වැඩි කරන ලද මිළ අනුව ගෙවීමට නව ලිඛිත ගිවිසුමකට එළඹියේය.

   පිනෙක්ස්ට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නිෂීට අවශ්‍යයව ඇත. දෙවන රෙදිපිළි තොගය සඳහා වන ලිඛිත එකගතාවයෙහි වලංගුතාවය අභියෝග කිරීමට නිෂීට හැකියාව පවතීද යන්න විශ්ලේෂණය කරන්න. ඔබේ පිළිතුර නඩු තීන්දු මගින් තහවුරු කරන්න.

   **(ලකුණු 10)**

   (ආ) අනවශ්‍ය බලපෑම් හේතුවෙන් අවලංගු කළ හැකි ගිවිසුම් පැහැදිලිව වෙනස් වර්ගීකරණයන් දෙකකට වැටේ.

   ඔබේ පිළිතුර විදහා දැක්වීම සඳහා නඩු තීරණද භාවිතයෙන් එම වර්ගීකරණයේ පදනම පැහැදිලි කරන්න.

   **(ලකුණු 10)**

   **(10 + 10 = ලකුණු 20)**

2. පාර්ශවයන් ගිවිසුමකට එළඹෙනු ලැබුයේ පසුව සාවද්‍ය බවට අනාවරණය වූ පොදු උපකල්පනයක් මත නම්, පොදු වැරදීම යන පදනම මත අධිකරණය එම ගිවිසුම අවලංගු කරනු ලැබේ.

   ඉංග්‍රීසි නීතිය සහ රෝම ලන්දේසි නීතිය යටතේ ඉහත ප්‍රකාශයේ වලංගුතාවය විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න. ඔබේ පිළිතුර අදාළ නඩු තීරණ මගින් තහවුරු කරන්න.

   **(ලකුණු 20)**

---හිමිකම් ඇවිරිණි---